වැ.බ. පොලිස්පති ටී.එම්.එස්.ඩී. තෙන්නකෝන් මහතා ගෙන් හා නියෝජ්‍යය පොලිස්පති- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් <u>පියුම් හස්තික (පියුමා) ගේ එකම භාරකරු වන ආච්චි අම්මා කරන ලද ඉල්ලීම.</u>

**<u>අවු: 2 යි මාස 2 සිට, කිරිදී, ලොකු මහත් කරන ලද, අපරාධ සැකකරු, හපුආරච්චිගේ දොන් පියුම් හස්තික (පියුමා) එක් වරක් හෝ දැක බලා ගැනීමට අවසරය දෙන ලෙසට කරනු ලබන ඉල්ලීම.</u>**

[redacted] සුමනාවතී, අවු: 72 යි, ජා.හැ.අ. 5[redacted] V, වැන්දඹු, [redacted] අළුබෝමුල්ල. දු.අ. 076 [redacted]

2024.02.21 දින දීය.

හපුආරච්චිගේ දොන් පියුම් හස්තික (පියුමා) අවු: 26 යි, මාගේ මුණුපුරා වේ.

ඔබ දන්නා පරිදි, 2024.02.15 දින, අත්අඩංගුවට ගෙන, මෙරටට ගෙන එන, මාගේ මුණුපුරා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ, රඳවාගෙන සිටී.

2024.02.17 වන දින, මා, මුණුපුරා බැලීමට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යන ලදි. සවස 4.00 වන තුරු බලා සිටියද, මුණුපුරාව මට පෙන්නුවේ නැත.

මා, ඉල්ලා සිටින්නේ, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර, මා, මිය ඇදීමට පෙර මුණුපුරාගේ මුහුණ බැලීමට ඉඩක් ලබාදෙන ලෙසටය.

- හපුආරච්චිගේ දොන් හස්තික (පියුමා) ගේ පියා, චමින්ද කැලුම්, මාගේ ලොකු පුතා වේ. ඔහු බ්‍රෝකර් රැකියාව කරන ලදි.
- මව, (ලේලිය) පිළියන්දල සමන්මලී.
- පියුම් හස්තිකට, අවුරුදු 2 මාස 2 දී, මව අතහැර යන ලදි.
- එදින පටන් මුණුපුරාට කිරි දී එදා වඩා ගත්තේ මාය.
- ඔහු ඉගෙන ගත්තේ, හිරණ කණිෂ්ඨ විද්‍යාලයේ ය. අ.පො.ස. (සා/පෙළ) දක්වාම එහි ඉගෙන ගත්තා.
- 2020 දී, ඔහු ගැහැණු ළමයෙකු සමග මිත්‍ර විය. ඒ කාලයේ සිට, ඔහු මත්ද්‍රව්‍යය වලට තදින් ඇබ්බැහි වීම නිසා, වැඩ පලෙන් ඉවත් කරන ලදි.
- එම කාලයේ, ඔහු සලිඳුව ආශ්‍රය කරන්නට පටන් ගෙන තිබේ.
- 2018 මැයි 03 වන දින, මුණුපුරාගේ පියා, මාගේ ලොකු පුතා හෘදයාබාධයකින් මිය යන ලදි.
- එතැන් පටන් මා සමග මුණුපුරා ජීවත් විය.
- ඔහු මිත්‍රවී සිටි ගැහැණු ළමයා සමග, පියා ගොස් හත් දවසේ දානය දුන්න දා සිට, එකට ජීවත් විය.
- පියුම්ගේ මව, විදෙස් ගතවීමෙන් පසුව, මේ දක්වාම, කිසිදු තොරතුරක් නැත.
- 2021 පෙබරවාරි 20 හෝ ආසන්න දිනයක මුණුපුරා, විදෙස් ගතවූ බව දැන ගන්නට ලැබින.
- විදෙස්ගත වීමෙන් දින 02 කට පමණ පසුව, මට දුරකථනයෙන් කථා කර, ඩුබායි සිටින බව කිව්වා.
- එයින් පසුව කිහිප වරක් කථා කරා.
- මා, නොහඳුනන අය පැමිණ, කිහිප අවස්ථාවක මුදල් දී ගියා. පියුම්ට ණය තියෙනවා ඒ මුදල් තමයි දෙන්නේ කියා.
- මා ජීවත් වන්නේ, අස්වැසුමෙන් ලැබෙන රුඃ 4500/- න් හා බ්‍රෝකර් වැඩවලින් ලැබෙන මුදලිනි.

- මට, කිසි දිනක, මුණුපුරා, ඩුබායි ගිය දා සිට, ගිණුමට මුදල් එවා නැත.
- 2023 නොවැම්බර් මස, ඔහු සමග මිත්‍ර වී සිටි, දෙවෙනි ගැහැණු ළමයා, රට ගිය බව දැන ගන්නට ලැබීය. මා ඇයව අඳුරන්නේ නැත.
- මාගේ ලොකු පුතා, බිරිඳ (පියුම් හස්තිකගේ මව) අතැර ගිය පසු බීමට ඇබ්බැහි වූ අතර, එය මුණුපුරාටද බලපෑ බව කියමි.

මා, මුලින් සඳහන් කරන ලද පරිදි, අවුරුදු 2 යි මාස 2 සිට, කිරි දී හදා වඩා ගත්, මුණුපුරා දැක බලා ගැනීමට, මා හට ඉඩ සලසන මෙන් ඉල්ලා සිටිමි.

මෙයට,

අ.ක/[redacted] සුමනාවතී
(ආච්චි)